# කෘෂි කර්මාන්තයේ දී ඇති වන පරිසර හානිය අවම කරමු

මිහිතලයේ පවතින සත්ත්ව හා ශාක සියල්ල ම අප වටපිටාවේ ඇති ස්වභාවික පාරිසරික සම්පත් මත රැඳී පවතී. අපගේ සියලු මූලික අවශ්‍යතා ඉටු කර දෙමින් අමුද්‍රව්‍ය, බලශක්තිය මෙන් ම අපගේ රැකියා මාර්ගයන් ද ඉටු කර දෙන මෙම පරිසර පද්ධතිය තුළින් සිදු වන්නේ නිම කළ නොහැකි සේවයකි. ලොව ජනතාවගෙන් 70% කගේ සේවාවන් පරිසර පද්ධතිය හා පවත්නේ සෘජු සබඳතාවයකි. විශේෂයෙන්, ලොව දිළිඳු ජනයාගේ ජීවන වෘත්තීන් ස්වභාවික පාරිසරික සම්පත් මත ම රැඳී පවතී. එමගින් පාරිසරික සම්පත් හානියට පත් වීම වැළැක්විය නොහැක. අතීතයේ දී අඩු ජනගහනයත්, සරල සමාජ පැවැත්මත් නිසාවෙන් පාරිසරික සම්පත් භාවිතය අවම වීම නිසා පරිසර පද්ධතියට හානි සිදු වූයේ ද අවම වශයෙනි. නමුත් වර්තමානයේ දී සංකීර්ණ වූ සමාජ පැවැත්ම නිසාවෙන් පාරිසරික සම්පත්වලට ඇතිවන බලපෑම මත පරිසරයේ සමතුලිතතාවයට දැඩි බලපෑම් එල්ල වී ඇත. 18 වන ශත වර්ෂයේ ලොව සිදු වූ කාර්මික විප්ලවය හේතුවෙන් ද, 1960 දශකයේ දී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ හරිත විප්ලවය හේතුවෙන් ද ජලය, භූමිය, වාතය යන පරිසර පද්ධතිවලට සිදු වූයේ දැඩි හානියකි. එසේ ම, නිසි කළමනාකාරිත්වයකින් තොරව, පාරිසරික සම්පත් භාවිතය ද පාරිසරික සම්පත් විනාශ වීමට හේතු වුනි. කාර්මික විප්ලවය නිසාවෙන් ඇති වූ ශීඝ්‍ර සංවර්ධනය මත මිනිසාගේ ජීවන තත්ත්වය උසස් වුවත්, කර්මාන්තශාලා අපද්‍රව්‍ය ජලයට, වාතයට, භූමියට එකතු වීමත් සමග එම සම්පත් දූෂණයට ලක් වීම ඇරඹුණි.

තාක්ෂණික හේතු මෙන්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රය නිසාවෙන් ද, පරිසර පද්ධතියට සිදු වන්නේ හානි කර තත්ත්වයකි. විශේෂයෙන් ම කෘෂිකර්මයේ දී, සිදුවන අක්‍රමවත් කෘෂිකාර්මික ක්‍රියා හේතුවෙන්ද, රසායන හා කෘත්‍රිම පොහොර භාවිතයන් නිසා ද, පරිසර පද්ධතිය දැඩි ලෙස දූෂණයට ලක් වෙමින් පවතී. විශේෂයෙන් ම, හරිත විප්ලවයත් සමග ව්‍යාප්ත වූ කෘෂි රසායන හා රසායනික පොහොර භාවිතය වැඩි වීම මෙයට මූලික හේතුන් විය. ජනගහන වර්ධනයත් සමග ඉහළ යන්නා වූ ආහාර අවශ්‍යතාව සඳහා වගා කළ යුතු භූමි ප්‍රමාණය ඉහළ යාම, කෘෂි ක්ෂේත්‍රය තුළ ඇති ශ්‍රමික හිඟය මෙන් ම ඉහළ අස්වැන්නක් ලබා ගැනීමේ අවශ්‍යතාවය යන කරුණු මත කෘෂි රසායනික සහ පොහොර භාවිතයට යොමු වීමට ගොවියාට සිදු විය. කෘෂි අස්වනු වැඩිවීමත්, ආදායම් වැඩිවීමත් සැලකීමේ දී හරිත විප්ලවය වැදගත් වුවත්, එහි අයහපත් ප්‍රතිඵල ලෙස සිදු වූ පරිසර දූෂණය නිසාවෙන්, මිනිසා ඇතුලු සත්ත්වයන්ගේ සෞඛ්‍යයට හා කෘෂිකර්මාන්තයේ පැවැත්මට ද තර්ජන එල්ල වී ඇති බව විවිධ රටවල කරන ලද පර්යේෂණ වලින් ඔප්පු වී ඇත.

මෙනිසා, ජල සම්පත් දූෂණයට ලක්වීම, මිහිතලය උණුසුම් වීම, වනාන්තර ක්ෂය වීම, ජීව පද්ධති විනාශ වීම වැනි පාරිසරික ගැටලු මෙන් ම මිනිසාගේ සෞඛ්‍යයට ඇති කරන බලපෑම් ගැන ද අද ලොව විද්‍යාඥයින්ගේ අවධානය යොමු වී තිබේ.

සංවර්ධනය කරා යන ගමනේ දී, ශ්‍රී ලංකාව ද දිනෙන් දින ඉහළ යන පාරිසරික ගැටලුවලට මුහුණ දේ. මෙහි දී කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්‍රියා හේතුවෙන් සිදුවන පාරිසරික හානිය පිළිබඳව වැඩි අවධානය යොමු කිරීම කාලෝචිත අවශ්‍යතාවයකි.

කෘෂිකාර්මික ක්‍රියා පිළිවෙත් නියාවෙන් සිදු වන පාංශු ඛාදනය හේතුවෙන් සිදුවන ඉඩම්වල සශ්‍රීක භාවය අඩු වීම මෙන් ම රසායන භාවිතය නිසා ඇති වන පාරිසරික දූෂණය උග්‍ර පාරිසරික ගැටලු දෙකක් ලෙස හඳුනාගෙන ඇත. විශේෂයෙන් ම, කෘෂිකර්මාන්තයේ දී ජලය හා භූමිය යන සම්පත් පරිහරණයේ දී සිදු වන අක්‍රමවත් ක්‍රියා පිළිවෙළවල් පාරිසරික හානිය උග්‍ර වීමට හේතුකාරක වේ. අක්‍රමවත් ලෙස යන්ත්‍ර සූත්‍ර භාවිතය, පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා නොකරමින් සිදු කරන වගාවන්, ජල සම්පාදන ක්‍රම, මේ තත්ත්වය උග්‍ර කරයි. ශ්‍රී ලාංකීය කෘෂිකර්මයට විශාල දායකත්වයක් දක්වන වියළි කලාපය තුළ සිදු කෙරෙන හේන් වගාවේ දී මෙන්

ම කුඩා ගෙවතු වගාවන්හි දී ද, කඳුකර ඉඩම්වල වගා කිරීමේ දී ද, ක්‍රමවත් පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතයක් දක්නට නොමැත. මේ නිසා පාංශු ඛාදනය හේතුවෙන් සිදුවන අහිතකර ප්‍රතිඵල දෙයාකාරය. එනම්, පසේ සාරවත් බව අඩුවීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාවය පහත වැටීමත්, අභ්‍යන්තර ජලාශ ගොඩවීම නිසා (ජල ධාරිතාව අඩුවීම හේතුවෙන්) පාරිසරික පද්ධතියට මෙන් ම කෘෂිකර්මාන්තයට බලපෑමක් ඇති වීමයි.

රසායනික පොහොර හා කෘෂි රසායන භාවිතය, පළිබෝධ නිසා ඇතිවන අස්වනු විනාශ වීම අඩුවීමටත් නිෂ්පාදනය වැඩි කිරීමටත් හේතු විය. එහෙත් රසායනික පොහොර හා පළිබෝධ නාශක භාවිතයේ දී ක්‍රමවත් ක්‍රියා පිළිවෙතක් අනුගමනය නොකිරීම කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ දැකිය හැකි තවත් ප්‍රධාන ගැටලුවක් බවට පත්ව ඇත. අද ශ්‍රී ලාංකීය කෘෂිකාර්මාන්තය තුළ ද පළිබෝධ නාශක බහුලව මෙන් ම විද්‍යාත්මක නොවන ආකාරයට භාවිතයට ගැනීම දක්නට තිබේ. කෘෂිකර්මාන්තයේ දී කෘෂි රසායන නියම ආකාරයට හා නියම ප්‍රමාණයට යෙදීම තුළින් රෝග මර්දනය සිදු වුවත්, බොහෝ පළිබෝධ නාශක මිනිස් ශරීරයට මෙන් ම පරිසරයට ද හානි දායක වේ. එමෙන් ම, පළිබෝධ නාශකවල බලපෑම ඇත්තේ එය භාවිතා වන ස්ථානයට පමණක් නොව මුළු පද්ධතියටමය. එසේ වන්නේ, ජලය හා වාතය මගින් පරිසර පද්ධතියට ම මෙම විෂ එකතු වන නිසාවෙනි. පළිබෝධ නාශකවලින් විනාශ වන්නේ වගාවට වින කරන සතුරු කෘමීන් පමණක් නොවේ. හිතකර කෘමීන් ද විනාශ වීම නිසා පාරිසරික සමතුලිතතාවය බිඳ වැටීම කෘෂිකර්මයේ තිරසර පැවැත්මට හානිකර වන්නකි. එසේම, පළිබෝධනාශක නිසා කෘමීන් බොහෝ රසායන ද්‍රව්‍ය වලට ඔරොත්තු දීමේ ශක්තිය ඇති වීම හේතුවෙන් තව තවත් නව රසායන ද්‍රව්‍යයන් කෘෂි ක්ෂේත්‍රයට හඳුන්වා දීම සිදු වේ. පළිබෝධ භාවිතයේ දී සිදුවන මෙවැනි අනාරක්ෂිත ක්‍රම නිසාවෙන් මිනිසාගේ සෞඛ්‍යයට මෙන් ම පරිසරයටත්, වගා බිමටත්, ජෛව විවිධත්වයටත්, පරිසර පද්ධතියටත් සිදු වන්නේ දැඩි හානියකි.

වාරිමාර්ග ආශ්‍රිත වී වගාව සහ හේන් ගොවිතැන බහුලව සිදුවන උතුරුමැද පළාතේත්, එළවළු වගාව බහුලව වන කල්පිටිය ප්‍රදේශයේත් උග්‍ර ලෙස ජල සම්පත් දූෂණය වී ඇති බව විද්‍යාඥයින් පෙන්වා දේ. ඔවුන් පෙන්වා දෙන අන්දමට මෙසේ අභ්‍යන්තර ජලාශ දූෂණය වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කෘෂිකර්මයේදී සිදු වන අධික කෘෂි රසායන භාවිතයයි. මේ හේතුවෙන් ජලජ ජීවීන් විනාශ වී යාමේ තර්ජනයත් සමග ම විෂ රසායන එකතු වූ ජලය පරිභෝජනයට ගැනීම හේතුවෙන් සෞඛ්‍යමය ගැටලු ද වාර්තා වී තිබේ.

දේශීය ආහාර අවශ්‍යතාවය සඳහා කෘෂිකර්මාන්තය දියුණු කිරීම පිණිස අරඹා ඇති කඩිනම් වැඩසටහන් දියත් කිරීමේ දී මෙසේ අක්‍රමවත් කෘෂිකාර්මික ක්‍රියා හේතුවෙන් සිදුවන පාරිසරික හානිය ගැන ද සැලකිල්ලක් දැක්වීම වැදගත් වන්නකි. ඒ සඳහා විද්‍යානුකූල වගා පිළිවෙත් අනුගමනය කිරීම සඳහා ගොවීන් යොමු කිරීම සැලකිල්ලට ගත යුතු වේ. මෙහි දී, විශේෂයෙන් පාංශු ඛාදනය වැළැක්වීමටත්, රසායන භාවිතයේ දී පාරිසරික හානිය අවම වන සේ කටයුතු කිරීමත්, නිසි කළමනාකාරීත්වයකින් පාරිසරික සම්පත් භාවිතයත් කෙරෙහි ගොවීන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

මේ සඳහා කෘෂිකාර්මික ප්‍රවේශයක් තුළින් මෙන් ම අධ්‍යාපන ප්‍රවේශයක් තුළින් විසඳුම් ලබා දිය යුතුව ඇත. කෘෂිකාර්මික ප්‍රවේශයක් තුළින් ගොවීන්ට අවශ්‍ය තාක්ෂණයත්, අධ්‍යාපන ප්‍රවේශයක් මගින් දැනුම හා අවබෝධය නිසි පරිදි ලබා දීමත් තුළින් මේ අරමුණු ඉෂ්ට කර ගැනීමේ හැකියාව පවතී. නිවැරදි කෘෂි තාක්ෂණික ක්‍රම භාවිතය පිළිබඳව නිසි අවබෝධයක් ගොවීන්ට ලබාදීමත්, ඒවා ක්‍රියාත්මක කිරීමට ගොවීන් උනන්දු කිරීමත් මෙහිලා වැදගත් වන්නකි. ආසියාවේ රටවල් හා සසඳා බැලීමේ දී ඉහළ අධ්‍යාපනයක් හා සාක්ෂරතාවක් ඇති ගොවි ප්‍රජාවක් වෙසෙන ශ්‍රී ලාංකීය සමාජය තුළ මෙය අපහසු නොවන කාර්යයකි. අවශ්‍ය වන්නේ මේ සඳහා අදාළ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතනවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ඒකාබද්ධතාවයකින් යුතුව කටයුතු කිරීමයි.

**එන්.එස්.බී. ඇපාකන්ද**
*පර්යේෂණ නිලධාරී*
**මානව හා ආයතනික සම්පත් සංවර්ධන අංශය**
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය